Department of Education, Sabaragamuwa Province/ Weekly School

# රසායනික බන්ධන

ඔබේ විද්‍යාව පෙළපොතෙහි I කොටසේ “රසායනික බන්ධන” පාඩම කියවා අවබෝධ කරගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) පහත වගුවේ හිස්තැන් පුරවන්න.

| අණුව | ලුවිස් තිත් ව්‍යුහය |
|---|---|
| $H_2$ | |
| $Cl_2$ | |
| $NH_3$ | |
| $H_2O$ | |

2) ජල අණුවේ ඇති අන්තර් අණුක බන්ධන නිසා එයට ලැබී ඇති සුවිශේෂී ගුණ මොනවාද?

3) පෙළපොතෙහි පිටු අංක 180 හි සඳහන් ක්‍රියාකාරකම 03ට අදාළ ඇටවුම ඔබට නිවසේදී සාදාගත හැකිය. එම ඇටවුම සකසා නිරීක්ෂණ වාර්තා කරන්න. මෙහි වියලි කෝෂය සඳහා 9V කෝෂයක් භාවිත කරන්න. මෙහි ඇති කොපර් සල්ෆේට්, පල්මානික්කම් ලෙස සිංහල බෙහෙත් වෙළඳසැළකින් 30g වැනි සුළු ප්‍රමාණයක් යොදාගන්න. බීකරය වෙනුවට ජෑම් බෝතලයක් යොදාගන්න. ක්‍රියාකාරකමෙන් පසුව සබන් යොදා අත් සෝදාගන්න.

| ද්‍රාවණය | බල්බය දැල්වේ/නොදැල්වේ. | විදුලිය සන්නයනය වේ/නොවේ. | සංයෝගයේ ඇති බන්ධන වර්ගය |
|---|---|---|---|
| සීනි ද්‍රාවණය | | | |
| කොපර් සල්ෆේට් ද්‍රාවණය | | | |
| ලුණු ද්‍රාවණය | | | |

4) සහසංයුජ සංයෝග හා අයනික සංයෝග අතර වෙනස්කම් 4ක් සඳහන් කරන්න.

5) අණුවක ඇති එකසර ඉලෙක්ට්‍රෝන යනුවෙන් හඳුන්වන්නේ මොනවාද?

6) පහත අණුවල ව්‍යුහයන් ඇඳ එහි ඇති එකසර ඉලෙක්ට්‍රෝන යුගල් ලකුණු කරන්න.

i) $CO_2$

ii) $N_2$

iii) $Cl_2$